**ශීර්ෂය 227- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේදෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනයකළමතය

**-------------------------------**

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේදෙපාර්තමේන්තුවේ2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020ජුනි 26දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020නොවැම්බර් 18දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවලින් 2019දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනයකළමතය සඳහා පදනම

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

**---------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීමසඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූසසන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම්ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛණය(BOSREPORT) හා මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදීසමාලෝචිත වර්ෂය ආරම්භයේ ජංගම නොවන වත්කම් 5 ක එකතුව රු.66,074,739ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි වත්කම් ශේෂ ලේඛනගත කිරීමට කටයුතු කල යුතු වීම. | CIGAS වැඩසටහන මඟින් ජංගම නොවන වත්කම් වාර්තාව ලෙස මුද්‍රණය කර ගත හැක්කේ පරිගණක මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනයේ (BOSREPORT) වාර්තාවයි. එහි ඇතුළත් වන්නේ 2019.12.31 දිනට දෙපාර්තමේන්තුව සතු භාවිතයේ පවතින සියළුම ජංගම නොවන වත්කම් වන අතර, එම වත්කම්වල ආරම්භක ශේෂ හා වර්ෂයේ මිලදී ගැනීම් ඉවත් කිරීම් වෙන් කර ලබා ගැනීමට CIGAS වැඩසටහනේ පහසුකම් සලසා නොමැත. |

### 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ටඅත්තිකාරම් ගිණුම් ශේෂ පරීක්ෂාවේ දී 2019 ජනවාරි 01 දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂය රු.95,375,184ක් හා | මෙම වෙනස්කම් හඳුනාගෙන අදාල නිවැරදි කිරීම් කළ යුතුවීම. | 2014 හා 2015 වර්ෂයේදී අවසාන ගිණුම් සකස් කිරීමේදී අප දෙපාර්තමේන්තුවට අනුයුක්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ වර්ෂ අවසාන ණය ශේෂ පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ලබා ගත් |

| | |
|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව එදිනට ශේෂය රු.95,368,040ක් වීම හේතුවෙන් ශේෂයන් අතර රු.7,144ක වෙනසක් පැවතිණි. | තොරතුරු පදනම් කරගෙන කටයුතු කර තිබේ. එම කාලපරිච්ඡේදයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් මෙම දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් බී ගිණුමට සිදු කරන ලද වැරදි හර හා බැර කිරීම් තුළින් මෙම වෙනස පැන නැඟී ඇති බව නිරීක්ෂණය වේ. ඉදිරියේදී මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගනිමි. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත - 2 වගන්තිය | ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ලියාපදිංචි කිරීම සඳහාපුද්ගල දත්ත නාමාවලියක් පිළියෙලකර නොතිබුණි.ජාතික හැඳුනුම්පතසකස් කිරීමට ලබාගත් තොරතුරුවල මෘදු පිටපත් පමණක් ඇති අතර එය දත්ත නාමාවලියක් නොවුණි. | පනත අනුව ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ලියාපදිංචි කිරීම කල යුතුවීම | ඉදිරියේදී සියලුම පුරවැසියන් ලියාපදිංචි කිරීමට අවධානය යොමු කරමින් රජයේ ප්‍රතිපත්තිමය තීරණවලට අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වැය විෂයයක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මඟින් | අවශ්‍යතා හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | 2019.09.17 දිනැති අමප/19/2307/114/051 – 1 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ පෙර මුද්‍රිත කාඩ්පත් මිලියනයක් මිලදී ගැනීමට කටයුතු කරන ලද අතර, එහිදී කාඩ්පත් |

| | |
|---|---|
| වෙන්කර ඇති රු.12,000,000ක ප්‍රතිපාදනයට මුදල් රෙගුලාසි 66/69 ප්‍රතිපාදන යටතේ හා පරිපූරක ප්‍රතිපාදන මඟින් පිළිවෙලින් රු.5,000,000ක් හා රු.71,000,000ක ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණි. වර්ෂය අවසානයේ මෙම ප්‍රතිපාදනවලින් රු.3,000,000ක් ඉතිරිවීතිබුණි. එයට හේතු ලෙස කාඩ්පත් හිඟතාවය දක්වා තිබුණද එම හේතු පිළිගත නොහැකි විය. | දෙපාර්තමේන්තුව වෙත ලැබීම ආරම්භ වූයේ 2019 නොවැම්බර් මස සිටය. එම නිසා පෙර මුද්‍රිත කාඩ්පත් හිඟතාවය මත 2019 අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර් යන මාසවලදී ජාතික හැඳුනුම්පත් මුද්‍රණය අපේක්ෂා කල පරිදි සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන්, තැපැල් හා සන්නිවේදන වැය විෂය (1402) යටතේ හැඳුනුම්පත් තැපැල් කිරීමට දරණු ලබන වියදම් හා පෙර මුද්‍රිත කාඩ්පත් හා ඒ ආශ්‍රිත කටයුතු වැය විෂය (2509) යටතේ හැඳුනුම්පත් මුද්‍රණය සඳහා දරණු ලබන වියදම් ද ඉතිරි වීම දක්නට ලැබුණි. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තුමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම වැඩක්, සේවයක් හෝ සැපයුමක් සඳහා වියදමකට නොබැඳී සිටිය යුතුයි.එසේ වුවදසමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තනප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා රු.4,484,507ක බැරකම් සඳහා එකඟවීම් ඇතිකරගෙන තිබුණි. | සමාලෝචිත වර්ෂයේ වියදම් සැළකිල්ලට ගෙන ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා බැඳී නොසිටිය යුතුවීම. | **විදුලිය හා ජලය**<br>අවශ්‍ය කාල සීමාවේ බිල්පත් නොලැබීම නිසා පාලනය කළ නොහැකි මට්ටමේ බැරකමක් ඇතිව තිබේ.<br><br>**වෙනත් වියදම්**<br>ප්‍රධාන කාර්යාලයේ හා පළාත් කාර්යාලවල ආරක්ෂක සේවා හා පවිත්‍ර සේවා අංශවල බිල්පත් ඉදිරිපත් වන්නේ ඊළඟ මාසයේ බැවින් මෙවැනි බැරකම් ඇතිවීම පාලනය කළ නොහැකි වී තිබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුවප්‍රාග්ධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදන ඉතිරියවූ රු.2,573,360ක වටිනාකම ඉක්මවා රු. 136,341,641ක වටිනාකම වූ බැඳීමකට එළඹ තිබුණි. | ප්‍රතිපාදන ඉතිරි වීම් පිළිබඳ සලකා බලා බැඳීම්වලට එළඹිය යුතුවීම. | 2019 සැප්තැම්බර් 17 දිනැති අංක අමප/19/2307/114/051 – 1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දුන් අනුමැතිය මත පෙර මුද්‍රිත කාඩ්පත් මිලියනයක් මිලදී ගැනීමට කටයුතු කරන ලදී.<br>එහිදී සැපයුම්කාර ආයතනය වෙත 2019.09.19 දින ඇණවුම් ලිපි යවන ලද අතර එම ආයතනය විසින් 2019 වර්ෂය තුල පෙර මුද්‍රිත කාඩ්පත් 250,000 ක් දෙපාර්තමේන්තුව වෙත සැපයූ අතර ඊට අදාල ගෙවීම් කටයුතුද 2019 වර්ෂය තුල අවසන් කරන ලදී.ඒ අනුව ඉතිරි කාඩ්පත් 750,000 සඳහා 2020 වර්ෂයේ ලැබුණ බැවින් බැඳීම්වලට එළඹ තිබුණි. |

**2.3** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහතසඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 500ක අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන්කරවා ගෙන ඉන් රු. මිලියන 251.83ක් වැය කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ප්‍රතිපාදනයෙන් සියයට 50ක් හෙවත් රු.මිලියන 248ක් ඉතිරි වී තිබුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ ව්‍යාපෘති අරමුණු ඉටුකිරීමට කටයුතු කල යුතුවීම. | ප්‍රාදේශීය කාර්යාල සඳහා ලබා දී ඇති VPN සම්බන්ධතාවය සඳහා බිල්පත් ගෙවීම ව්‍යාපෘති කාලය 2019.10.31 දිනෙන් අවසන් වීම මත ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් 2019 වසරේ අවසන් කාර්තුවේ සිදු නොකිරීම හා ප්‍රධානතම ප්‍රසම්පාදනයන් වන ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීම, e-NIC ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල සඳහා අවශ්‍ය අනෙකුත් තාක්ෂණික උපකරණ මිලදී ගැනීම ව්‍යාපෘතිය දීර්ඝ නොවීම මත තාවකාලිකව නතර වීම ICAO ඡායාරූප ලබා ගැනීමට අදාල මෘදුකාංග මිලදී නොගැනීම මත මෙලෙස ප්‍රතිපාදන ඉතිරිව ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයට අදාල වන අනු කාර්යයන් 36 අතුරින් කාර්යයන් 16ක කිසිඳු භෞතික ප්‍රගතියක් නොමැති අතර, ඉන් කාර්යයන් 11ක් ඉටු කිරීමට නොහැකි වූයේ ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම පිළිබඳව 2019 දෙසැම්බර් 31 දින දක්වා නිශ්චිතතාවයක් නොමැතිවීම නිසාවෙනි.එම නිසා සියයට 10ත් සියයට 25ත් අතර ඉතා පහල භෞතික ප්‍රගතියක් පමණක් ලබා කර ගත් කාර්යයන් 08ක් ඒ අතර ඇති බව තව දුරටත් නිරීක්ෂණය විය. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ ව්‍යාපෘති අරමුණු ඉටුකිරීමේ කටයුතු කඩිනම්කළ යුතු වීම | සැලසුම් කරන ලද කාර්යයන් බොහෝමයක ප්‍රසම්පාදන කටයුතු අත් හිටවන ලද අතර, දත්ත රැස්කිරීමේ හා දත්ත විද්‍යුත්කරණයට අදාල කාර්යයන් සංශෝධිත ව්‍යාපෘති වාර්තාව ලැබෙන තෙක් නතර විය. නැවත 2019 වර්ෂයට අදාල ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. එහෙත් සැලසුම් කරන ලද කාර්යයන් හා ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු මාස 09ක් වැනි කෙටිකාලයක් තුළ ඉටු කිරීමට නොහැකි වීම මත හා දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය සඳහා තවත් වසර 1 ½ක් හෝ 2ක් පමණ කාලයක් අවශ්‍ය වන බැවින් සඳහන් කරන ලද කාර්යයන් 16ක් ඉටු කිරීමට නොහැකි වී ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර දෙසැම්බර් මස නිම කිරීමට අපේක්ෂා කලද උතුරුමැද, ඌව සහ සබරගමුව පළාත් කාර්යාල ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් සොයාගත නොහැකි වීම මත ආරම්භ කර නොතිබුණි.කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය 2017වර්ෂයේ සිට ක්‍රියාවට නැංවීමට සැලසුම් කරතිබූ මෙම ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් මස වනවිටත් නිම කර නොතිබුණි. | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ ව්‍යාපෘති අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතුවීම. | මෙම පළාත් කාර්යාලයන් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හෝ ගොඩනැඟිලි පහසුකම් සෙවීම් කාර්යය දෙපාර්තමේන්තුවේ පාලන අංශය මඟින් සිදුකරන ලද අතර, සැලැසුම් කල පරිදි කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූයේ අදාල කාර්යාල ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සහිත ඉඩම් හෝ ගොඩනැඟිලි සොයාගැනීමට තවමත් නොහැකි වීම නිසාය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල හැඳුනුම්පත් නොමැති පුද්ගලයන් පිළිබඳව තොරතුරු 2018 වර්ෂයේදී ග්‍රාමසේවා වසම් මට්ටමින් එක්රැස් කර තිබූ අතර එම තොරතුරු අනුව වසම් 55 ක පුද්ගලයන් 1097 දෙනෙකුට හැඳුනුම්පත් නොමැති තත්ත්වයක් 2019 වර්ෂය වන විට පැවතුණි. | ශ්‍රී ලංකික පුද්ගලයන්ට හැඳුනුම්පතක් ලඟතබා ගැනීම පිළිබඳව ඔවුන් ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීම කළ යුතුවීම. | මේ වන විට හැඳුනුම්පත් ලබා නොගත් පුද්ගලයන් වෙත ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. |

### 3.2 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | හම්බන්තොට සූරියවැව තාක්ෂණික උද්‍යානයේ ආපදා ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීමසම්බන්ධයෙන් රු.මිලියන68.5 ඇස්තමේන්තුවට අදාලව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත රු.11,776,333ක් ගෙවා තිබුණි. එහෙත් එම මධ්‍යස්ථානයේඉදිකිරීම වෙනත් ස්ථානයකට ගෙනයාම හේතුවෙන් අවස්ථා තුනකදී රු.9,901,137ක් කාර්යංශය විසින් ආපසු ගෙවා තිබුණද, | ඉතිරි වටිනාකම එම ආයතනයෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | CECBආයතනයෙන් අය විය යුතු රු.11,776,333.75 මුදලින් රු.4,000,000ක් ව්‍යාපෘතිය වෙත 2018.10.05 දිනද, රු.4,000,000ක් ව්‍යාපෘතිය වෙත 2019.01.16 දිනද, රු.1,901,137.27ක් ව්‍යාපෘතිය වෙත 2019.05.29 දිනද ලබා දී ඇත. මෙලෙස උක්ත අයවිය යුතු මුදලින් රු.1,901,137.27 ව්‍යාපෘතිය වෙත ලබා දී ඇත. මෙම කාර්යය සඳහා ව්‍යාපෘතිය විසින් එකතු කළ අගය මත බද්ද (VAT) සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන බදු සහන ලිපිය ලබා නොගැනීම හේතුවෙන් CECB ආයතනය විසින් සාමාන්‍ය බදු ගණනය කිරීමේ පදනම යටතේ බදු |

| | | | |
|---|---|---|---|
| | ඉතිරි මුදල වූ රු.1,875,196 ක් විගණිත දිනය දක්වා ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>. | | අයකර ඇත. එබැවින් ඉතිරි මුදල රු.1,875,196.48ක මුදල CECBආයතනය විසින් ආපසු ලබාදීමේ හැකියාවක් නොමැති බව අංක CB/EPC/SP/DOH/DI826/017 හා 2019.05.28 දිනැති ලිපිය මඟින් ව්‍යාපෘතිය වෙත දන්වා ඇත. |
| (ආ ) | 2019 වර්ෂය තුලදී හැදුනුම්පත් මුද්‍රණය කිරීමේදී විවිධ දෝෂයන් හේතුවෙන් සාමාන්‍ය සේවය යටතේ සියයට 2ක සිට සියයට 14 ක් දක්වා ප්‍රමාණයක් හා එක්දින සේවය යටතේ සියයට 6ක සිට සියයට 9 ක් ප්‍රමාණයක්ද අපතේ ගොස් තිබුණි. එසේ වුවද මෙම කාඩ්පත් 76,608 වෙනුවෙන්ද දෙපාර්තමේන්තුව විසින් රු.9,895,402ක පිරිවැයක් දරා තිබුණි. | මුද්‍රණය කිරීමේදී විවිධ දෝෂයන් අවම වන පරිදි කටයුතු කිරීමට වග බලා ගතයුතුවීම. | දෙමළ භාෂාවෙන් තොරතුරු ඇතුළත් කිරීමේ දී සිදුවන දෝෂ හේතුවෙන් හැඳුනුම්පත් වැඩි වශයෙන් නැවත මුද්‍රණය කිරීමට සිදුවන අතර, මීට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සිංහල දෙමළ ද්වි භාෂාවෙන් කටයුතු කළ නිලධාරීන්ගේ හිඟය වේ. අවශ්‍ය ප්‍රවීනතාවය ලත් නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බැවින්, මේ වන විටද මෙම ගැටළුව විසඳී නොමැත. |

**3.3 අනාර්ථික ගනුදෙනු**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සූරිය වැව ආපදා ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථානයේ සවි කරන ලද තාරා පැවිය කුරුණෑගල වැවගෙදර ඉඩමේ ආපදා ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථානය ඉදි කිරීමට ප්‍රථමයෙන්ව්‍යාපෘතියසඳහාකම්කරු වියදම ලෙස රු.87,840ක් ද , ලංකා විදුලි බල මණ්ඩලයට සැපයුම් ගාස්තු ලෙස රු.5,636,195ක්ද තැන්පතු ගාස්තුවක් ලෙසරු.187,500ක්ද ගෙවා තිබුණි. | ඵලදායී කාර්යයන් හඳුනාගෙන වියදම් දැරීම කල යුතුවීම | කුරුණෑගල පිහිටුවීමට යෝජිත ආපදා ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථානය සඳහා 150 KVA (216 A) තාරාපැවියක් සවිකිරීමට අවශ්‍ය වූ බැවින් සූරියවැව ස්ථාපිත කර තිබූ තාරාපැවිය එම ස්ථානයට සවි කිරීමට කටයුතු කිරීම සඳහා වියදම් ඇස්තුමේන්තුව අනුව ලබාදෙන ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් 2018.02.16 දින දකුණු පළාත් විදුලිබල මණ්ඩලය යොමු කරන ලදී. එම ලිපියට පිළිතුරු ලෙස එවැනි විතැන් |

| | | |
|---|---|---|
| | | කිරීමකදී ලංකා විදුලිබල මණ්ඩලයේ 2016.07.11 දිනැති හා අංක 2016/DCC/COM/12 චක්‍රලේඛය ප්‍රකාරව තොග සැපයුම් උපපොළ ගලවා ඉවත් කිරීමට කම්කරු වියදම් ලෙස රු.87,840ක් විය. ඉතිරිවන වටිනාකම සමඟ 150 KVA (216 A) තාරාපැවිය කුරුණෑගල ස්ථාපිත කිරීම සඳහා උක්ත අඩු කිරීම සලකා බැලීමෙන් අනතුරුව අවශ්‍ය වන ඇස්තමේන්තු මුදල ලෙස රු.2,316,489.80ක් ලෙස ගණනය කර ඇත. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 8:12 මාර්ගෝපදේශයේ (අ), (ආ) ඡේදයන්ගෙන් බැහැරව2019 වර්ෂයේදී මිලදී ගත් කාඩ්පත් මිලියනය ස්වාධීන පරීක්ෂණාගාරයකට යවා පරීක්ෂාවට ලක් කිරීමට හෝ ගෙවීම් කිරීමට පෙර මෙහෙයුම් අංශයෙන් කාඩ්පත්වල මුද්‍රණ තත්වයන් පිළිබඳව තහවුරුවක් හෝ ලබා නොගෙන කර ඇති ගෙවීම්වල වටිනාකම රු. මිලියන 161.09 ක් විය. | රජයේප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරවඅතුරු ගෙවීම්,අවසාන ගෙවීම් සිදු කිරීමට පෙර සපයා ඇති භාණ්ඩවල ගුණාත්මකභාවය ස්වාධීනව පරීක්ෂාකර බැලිය යුතු වීම. | පිළිතුරු ලබා දී නැත |
| (ආ) | කොමසාරිස් (මෙහෙයුම්) ගේ ලිපිය ප්‍රකාරව පෙර මුද්‍රිත කාඩ්පත් සඳහා ආරක්ෂිත තොග මට්ටමක් නිසි පරිදි පවත්වාගෙන යාමට නොහැකි වූ බව හා නැවත ඇණවුම් මට්ටම පවත්වා ගැනීමට නොහැකි වූ බව ද දක්වා තිබූ අතර හැඳුනුම්පත් නිකුත් කිරීම වැනි ජාතික වැදගත්කමකින් යුත් කාර්යක් සඳහා මනා තොග පාලනයක් දෙපාර්තමේන්තුව සතුව නොමැති බව මේ අනුව විගණනයේදී නිරීක්ෂණය විය. | තරඟකාරිත්වය තුළින් ගුණාත්මක කාඩ්පතක් ලබා ගැනීමට කටයුතු කල යුතුවීම | පිළිතුරු ලබා දී නැත |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තාවකාලික (Interim) ජාතික හැඳුනුම්පත හඳුන්වා දී ඇත්තේ විද්‍යුත් ජාතික හැඳුනුම්පත හඳුන්වා දෙන තෙක් පමණක් වන අතර, විද්‍යුත් ජාතික හැඳුනුම්පත හඳුන්වා දීම ප්‍රමාද වීම නිසා මෙම තාවකාලික ජාතික හැඳුනුම්පත්කාඩ්පත වෙනුවෙන් මෙතෙක් රු.360,140,662 ක මුදලක් වැය කර තිබුණි. විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වනතෙක් අවසන් වී නොමැති අතර,2019 වර්ෂයේ අවස්ථා 03 කදී අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් කාලය දීර්ඝ කර තිබුණි.<br><br>එසේම2011 වර්ෂයේ සිට 2020 සැප්තැම්බර් දක්වා ව්‍යාපෘතිය වෙනුවෙන්මුළු වියදමරු. 2,250,680,000 ක් දරා තිබුණද විගණිත දිනය දක්වාම විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ජාතික හැඳුනුම්පත හඳුන්වාදීම කඩිනමින් සිදුකල යුතුව පවතින අතර දෛනික ජාතික හැඳුනුම්පත ඉල්ලුම්කරුවන් වෙත ලබා දෙන සේවාවේ ගුණාත්මකභාවය හා අඩුකාලයක් තුළ ලබා දීමට හැකිවන පරිදි පිළිවෙතක් සැකසිය යුතු වීම | පිළිතුරු ලබා දී නැත |
| (ඈ) | කෑගල්ල, රත්මලාන, මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සාමාන්‍ය සේවය යටතේ හැඳුනුම්පත පිළියෙල කර ගැනීම සඳහා ග්‍රාම නිළධාරීන් හරහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු අංශය වෙත ලැබී වර්ෂ 02ක සිට මාස 06ක කාල පරාසයක අඩුපාඩු සහිත අයදුම්පත් 50 ක් පැවතින. | ප්‍රමාදයකින් තොරව හැඳුනුම්පත් නිකුත් කිරීමේ කටයුතු සිදු කිරීම කළ යුතුවීම | විගණන වාර්තාවෙහි සඳහන් වනුයේ ප්‍රාදේශීය කාර්යාල මඟින් ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු අයදුම්පත් වේ. එවැනි අයදුම්පත් සතිපතා ප්‍රධාන කාර්යාලය වෙත චක්‍රලේඛ මඟින් උපදෙස් ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් අදාල සංවර්ධන නිළධාරී විමසන ලද අතර, ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව අයදුම්පත් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | හැඳුනුම්පත් සෑදීමට ලබාදෙන අයදුම්පත්‍ර කට්ටලයේ ඇති දෝෂ සහගත ලේඛණ හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ නිති අංශය වෙත යොමු කර ඇති අයදුම්පත්‍ර 28 ක් කෑගල්ල, රත්මලාන, වේල්ලවීදිය මොරටුව ප්‍රදේශීය ලේකම් කාර්යාලයන්හි රැඳී තිබුණි. මෙම අයදුම්පත්‍ර සඳහා දින 31ක සිට 227 ක් දක්වා කාලයක් ගතවී තිබුණි. | හැඳුනුම්පත්ලබා ගැනීම සඳහා නිවැරදි ලේඛණ ඉදිරිපත් කලයුතු බව සෑම ශ්‍රී ලාංකිකයෙකුම දැනුවත් කිරීමට කටයුතු කළ යුතුවීම. | විගණන වාර්තාවේ සඳහන් අයදුම්පත් නීති අංශය වෙත යොමුකරන ලද අයදුම්පත් වන අතර මේ වන විට අදාල විමර්ශන කටයුතු සිදු වෙමින් පවතී. |
| (ඊ) | සාමාන්‍ය සේවය යටතේ හැඳුනුම්පත සාදා ගැනීම සඳහා ග්‍රාම නිලධාරී හරහා කෑගල්ල, රත්මලාන, වේල්ලවීදිය මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමේ දී ඒ සඳහා දින 14 ක සිට දින 325ක කාල පරාසයක් ගත වී තිබූ අවස්ථා 2226 ක් පැවතුණි. | ප්‍රමාදයකින් තොරව හැඳුනුම්පත් නිකුත් කිරීමේ කටයුතු සිදු කළ යුතුවීම. | අයදුම්පත් ප්‍රාදේශීය කාර්යාල වෙත ඉදිරිපත් කරන ග්‍රාම නිලධාරීන් කොට්ඨාශ දිනයන්හිදී ඒ සම්බන්ධයෙන් දැනුවත් කර එම ප්‍රමාදයන් අවම කර ගැනීමට උපදෙස් දෙන ලෙස සංවර්ධන නිලධාරීන් දැනුවත් කරන ලදී. |

**4. යහපාලනය**

--------------

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා වන විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත් කිරීම සඳහා වන පෙර මුද්‍රිත කාඩ්පත් ප්‍රසම්පාදනය 2016 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, 2019 වර්ෂයේ 173,000ක ආරම්භක කාඩ්පත් ශේෂයක් පැවතුණි.එසේ තිබියදී 2019 වර්ෂය තුළදී කාඩ්පත් මිලියන 01ක් මිළදී ගැනීම හා කාඩ්පත් 958,594ක් නිකුත් කිරීමත්, කාඩ්පත් 76,608ක් හානි හෝ පළුදු වීම (Due Spoil) හේතුවෙන් පැවති වර්ෂ අවසාන කාඩ්පත් ශේෂය 106,608ක් වුවද, වර්ෂය අවසානයේ නිකුත් කිරීම සඳහා පැවති අයදුම්පත් සංඛ්‍යාව 383,465ක් වීම හේතුවෙන් වර්ෂය අවසානයේදී කාඩ්පත් 276,857ක හිඟයක් පැවති බව නිරීක්ෂණය විය. | කාඩ්පත් මිලදී ගැනීමේ හා අයදුම්පත්‍ර ලැබීමේ පුරෝකතනයන් කර ඒ අනුව ප්‍රමානවත් තරම් මිලදී ගැනීම් සිදු කළ යුතුවීම. | ලබාදුන් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පුද්ගලයින් 383,465 දෙනෙකුට හැඳුනුම්පත් නිකුත් කල යුතුව ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවෙහි අනුමත සේවක සංඛ්‍යාව 1401 වන අතර සත්‍ය සේවක සංඛ්‍යාව 1276 කි. ඒ අනුව 125 පුරප්පාඩු පවතී. උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා දෙපාර්තමේන්තුවෙහි අනුමත කාර්ය මණ්ඩලයක් නොපවතින අතර 15 දෙනෙකු බඳවාගෙන තිබුණි. | අවශ්‍යතා අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවීම. | තනතුරු පුරප්පාඩු සඳහා වැඩබලන නිලධාරීන් පත් කර ඇත. සමහර තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් කටයුතු සිදු කර ගෙන යන බව. |